PR/2020/S 09

# ජපන් තානාපති කාර්යාලය


නො. 20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව

**දුරකථනය**:94-11-269-3831~3, **ෆැක්ස්** : 94-11-269-8629

**ඊ-මේල්** : cultujpn@sltnet.lk


ජූලි 08, 2020

## පුවත්පත් නිවේදනය

**ජපානය, ජපන් යෙන් මිලියන 800 ක් (දළ වශයෙන් රුපියල් මිලියන 1,400 ක්) වටිනා වෛද්‍ය උපකරණ තොගයක් ශ්‍රී ලංකාවේ කෝවිඩ් -19 ට එරෙහි සටන වෙනුවෙන් ප්‍රදානය කරයි.**

ජපන් රජය විසින් ජපන් යෙන් මිලියන 800 ක් (දළ වශයෙන් රුපියල් මිලියන 1,400 ක් ) වටිනා වෛද්‍ය උපකරණ ප්‍රදානයක් කෝවිඩ් -19 පාලනය කිරීමට වෛද්‍ය අංශ ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ලබා දී ඇත. මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා දෙරට අතර හුවමාරු පත්‍ර අත්සන් කිරීම 2020 ජූලි 08 වෙනි දින මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදී, ශ්‍රී ලංකාවේ ජපන් තානාපති සුගියම අකිරා මහතා සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර් ආටිගල මහතා විසින් සිදුකරනු ලැබිය.

මේ වන විට කෝවිඩ් -19, ඉතා විශාල ආර්ථික හා සමාජීය බලපෑමක් සහිතව ලංකාව ඇතුළු මුළු මහත් ලෝකයේම මිනිස් සංහතියට බරපතල තර්ජනයක් එල්ලකොට ඇත. මෙවැනි හදිසි වෛද්‍ය පසුබිමක් තුල ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම අනුව 2020 මාර්තු මස සිට ජපන් රජය වෛද්‍ය උපකරණ සහ තාක්ෂණික සහය ශ්‍රී ලංකාවට ලබා දෙමින් පවතී. පෙර නොවූ විරූ මෙම අභියෝගාත්මක තත්වය පාලනය කිරීම හමුවේ ශ්‍රී ලංකා රජය විසින් දක්වන ලද ශක්තිමත් නායකත්වය පිළිබඳ ජපන් රජය ප්‍රශංසා කරන අතර, ශ්‍රී ලංකා රජයේ ඉල්ලීමකට අනුව මෙම ආධාර ප්‍රදාන දීර්ඝ කරමින් අවශ්‍ය වෛද්‍ය උපකරණ සැපයීමටත් ඒ තුලින් මෙවැනි වසංගත තත්වයන්ට මුහුණ දීමට සුදුසු වන ලෙස සෞඛ්‍ය සේවාව දියුණු කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම ප්‍රදානය යටතේ සපයන ලද වෛද්‍ය උපකරණ අතර MRI ස්කෑනර් යන්ත්‍ර, C.T ස්කෑනර් යන්ත්‍ර, X කිරණ පද්ධති සහ මධ්‍යම නිරීක්ෂණ යන්ත්‍ර (Central Monitors) ඇතුලත් වන අතර, ඒවා කඩිනමින් කෝවිඩ් – 19 මර්දනය කිරීම් කටයුතු සිදුකරන තෝරාගත් රෝහල් හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වල ස්ථාපිත කරණු ලැබේ.

දෙරට අතර පවතින දිගුකාලීන සුහදත්වය සැලකිල්ලට ගැනීමේදී ජපානය විශ්වාස කරන පරිදි, මෙම ප්‍රදානය වර්තමාන ජාතික අවශ්‍යතාවය සපුරාලීමට ශක්තියක් වනවා පමණක් නොව, තිරසාර වෛද්‍ය ක්‍රමයක් ලංකාව තුල ඇති කරගැනීමට ද අත්වැලක් වනු ඇති. තවද එය අනාගතයේ දී දෙරට අතර අන්‍යෝන්‍යය අවබෝධය ගෞරවයෙන් යුතුව වර්ධනය කරගැනීමට මහඟු පිටිවහලක් ද වනු ඇත.

---


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය 011-269-3831~3 (දිගු අංකය 226)